# සීගිරි බිතුසිතුවම්

සෙනරත් පරණවිතාන

ලංකාවෙ දැනට ඉතිරිවෙල තියෙන අතීතකාලෙ සිතියම් අතරින් පැරණිම ඒවා ඇත්තෙ සීගිරියෙ. ඒවා ඇඳපු තැනත් ආකාරයත් එයින් දක්වෙන වස්තුවත් අනුව සීගිරි සිතුවම් ඉන්දියාවෙත් ලංකාවෙත් ඉන් එහා හරි මෙහා හරි කාලයකට අයිති සිතියම්වලට මුළුමනින්ම වෙනසියි. ඉන්දියාවෙත් ලංකාවෙත් වෙන තැන්වල පුරාණ සිතියම් ඇඳල තියෙන්නෙ එක්කො ගල්ලෙණක නැත්නම් මැදුරක බිත්තිවලයි. අලංකාර රටාවල් ඇරුණාම මෙබඳු සිතියම් යම්කිසි සිද්ධියක් නැත්නම් අවස්ථාවක් දක්වන්නයි ඇඳල ඇත්තෙ. සීගිරියෙ සිතුවම් ඇඳල තියෙන්නෙ ළඟාවිය නොහැකි ලෙසට කෙළින් නගින පරුවත ඇලයකයි. ඒ සිතුවම්වල දක්වල ඇත්තෙ තනිව නැතිනම් දෙන්නෙක් එකට ඉන්න අලංකාර ලෙසට සැරසුණු සිරුරේ ඉණෙන් ඉහළ කොටස පමණක් පෙන්වල ඇති වලාකුළුවලින් මතුවෙන ගෑනු රූපයි. පබ්බාර තැනක තියෙන නිසා අව්වෙන් වැස්සෙන් බේරුණු රූප විසි දෙකක් පමණයි දැන් දකින්න තියෙන්නෙ. නුමුත් පුරාණයේදී මෙබඳු රූප සියගණනක් සීගිරි පරුවතේ බස්නාහිර පැත්තේ කටාරයෙන් පහලත් කැටපත් පවුරෙන් ඉහලත් තිබුණු බවට ඒකාන්ත සාදක තියෙනව.

සීගිරි සිතුවම්වලින් නිරූපිත වස්තුව ගැන විවිධ මත පළ කෙරිල තියෙනව. ඒ සිතුවම්වල ඇඳල ඇත්තෙ සීගිරි නුවර කෙරෙවූ කස්සප (කසුබ) රජ්ජුරුවන්ගේ බිසෝවරුන් එයාගෙ ගිරේ හිටපු ළඳුනුන්ය කියලයි සමහරුන්ගෙ අදහස. වලාකුළුවලින් නගින හැටියට ඇඳල ඇති මේ රූප අප්සරාවන්ගේය කියල තවත් අය පවසනව.

මේ පිළිබඳව මගේ අදහස මීට අවුරුදු දොළහකට ඉහතදී ඉංගිරිසියෙන් ලියල පළකරපු නිබන්ද දෙකක දීල ඇති. සීගිරියෙ සිතුවම්වල පෙනෙන රන්වන් ලියෝ විජ්ජු (විදුලිය) කුමාරියෝ බවත් නිලුපුල්වන් ලියෝ මෙඝලතාවෝ බවත් එක නිබන්ධයක සාදක සහිතව දක්වල ඇති. ''සීගිරිය දෙවරාජ බවනයක්'' යන අනිත් නිබන්දයෙ කසුබ රජු සීගිරිය කෙරෙවුවෙ සතුරන්ගෙන් ආරක්ෂාවීමට නොවන බවත් ඒ කාලයේ පැවති රාජධර්මයක් අනුව තමා භූලෝකයේ දේවරාජයෙක්ය කියල මිනිසුන්ට වටහන්නය යන බවත් නොයෙක් හේතු උදහරණ

වන්න පුළුවන කියල මහජනයට තර්ක කරන්න පුළුවනි. ඒ බලය ඇති කෙනෙකුට අවනත වෙලා හිටීම නුවණට හුරුය කියලත් ඒ කාලයේ මහජන මතය වෙන්න ඇති. ඒ නිසා අලකා-පතියෙකු හැටියට තමන් ගිවිස්වා ගැනීම රජෙකුට ඒ කාලයේදී තමන්ගේ රජකම තහවුරු කර ගැනීමට උපායක් වෙන්න ඇති. ඒ හැඟීම ඇති කිරීමට උපකාර වුණු සිගිරි සිත්තම්වල අපට දැන් පෙනෙන ළඳුන්ට ඒ කාලයේ දේශපාලනයේ වැදගත් තැනක් අයිතිව තිබුණු බව මෙයින් වැටහේවි.